පන්නල ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 05 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3.4 හා 1.3.6 ඡේදයන්හි දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2012 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 2.3.2(අ) ඡේදය මගින් පෙන්වා දී ඇති වැරදි නිවැරදි කිරීම සඳහා සමුච්චිත අරමුදල හරකළ යුතු රු.99,908 ක් ටෙන්ඩර් මගින් කුලියට දීම් ගිණුම හරකිරීම මත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාලව කසල ගාස්තු (2-13) බිල්කිරීම රු.206,164 ක් වුවද, රු.12,255 ක් ලෙස ගිණුම් ගතකිරීම හේතුවෙන් කසල ගාස්තු ආදායම රු.193,909 ක් අඩුවෙන් හා වර්ෂය අවසානයට පැවතිය යුතු රු.25,169 ක හර ශේෂය රු.168,740 ක බැර ශේෂයක් බවට පත්ව තිබුණි.

(ඇ). 2012 වර්ෂයේ පරිසර තැන්පතු ආපසු ගෙවීමේදී සමුච්චිත අරමුදල බැරකලයුතු වූ රු.126,875 ක ප්‍රමාණය ජ'නල් සටහන් අංක 64 හා 65 මගින් විශේෂ බලපත්‍ර ගාස්තු ආදායම් (5-36) හා ලියාපදිංචි කිරීමේ හා සහතික කිරීමේ ගාස්තු ආදායම් (5-41) ගිණුම් වලට බැර කිරීම මත වර්ෂයේ ආදායම රු.253,750 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ). 2011 හා 2012 වර්ෂ වලට අදාලව සමාලෝචිත වර්ෂයේ ලද රු.3,494,504 ක මුද්දර ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගතකිරීම මත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ). 2012 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේ ලද රු.982,285 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම් සමාලෝචිත වර්ෂයට අදාල ආදායමක් ලෙස ගිණුම් ගතකිරීම මත සමාලෝචිත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් රු.982,285 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂය අවසානයට පොදු සැපයුම් ණයහිමියන් රු.105,198 ක් අඩුවෙන් හා ගෙවිය යුතු ණය පොලී වෙන් කිරීම් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ). සමාලෝචිත වර්ෂයට අදාල ආසියානු සංවර්ධන ණය වෙනුවෙන් ගෙවූ පොලී මුදල් වියදම රු.1,300,165 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ). සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වැටුප් හා ගමන් වියදම්, එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා මුද්දර බදු පිළිවෙලින් රු.1,094,375 ක්, රු.596,666 ක්, රු.101,001 ක් හා රු.78,300 ක් වැඩියෙන්ද පොදු සැපයුම් ණය හිමියන් රු.1,870,342 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ). වැටුප් හා දීමනා වියදම් රු.63,527 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර, වැටුප් ප්‍රතිපූර්ණ ආදායම ද රු.109,726 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ). සමාලෝචිත වර්ෂය තුල කඩ කාමර බදුදීම් වලට අදාල පෙර ගෙවුම් මුදල් ලෙස ලද රු.2,224,901 ක් වර්ෂයේ ආදායමට ගෙන නොතිබුණි.

(ඔ). සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාග්ධන වියදම (309) යටතේ ගිණුම් ගතකල යුතු රු.34,443,756 ක් ජ'නල් සටහන් අංක 84 මගින් ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු (304) පුනරාවර්තන වියදම් යටතේ ගිණුම් ගතකිරීම මත ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා නඩත්තු වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර, ප්‍රාග්ධන වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඕ). ආදායම් ශීර්ෂ 10 කට අදාලව 2011 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් අනුව හා ආදායම් ලේඛන අනුව වූ රු.9,987,147 ක වෙනස කපාහැරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අංක 12 සිට 21 දක්වා වූ ජ'නල් සටහන් මගින් සමුච්චිත අරමුදල හරකර අදාල ආදායම් ලෙජර් ගිණුම් බැරකිරීම මත වර්ෂයේ ආදායම රු.9,987,146 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති, පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම මත සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ශේෂය රු.4,200,774 ක්ව තිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාල බිල් කිරීම් හා අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 22 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු. 31,580,825 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 අවිනිශ්චිත ගිණුම්

2013 ජනවාරි 01 දිනට අවිනිශ්චිත ස්වභාවයේ ගිණුම් වල බැර ශේෂය ලෙස රු.73,766 ක් පැවතියද, සමාලෝචිත වර්ෂය තුල ජ'නල් සටහන් අංක 102 මගින් එය සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැර තිබුණි.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.126,950,367 ක් වූ අතර, ඊට අදාල කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.101,203,572 වු අතර, එයින් රු. 8,053,839 ක් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 147,486,468 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.326,037 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,155,518 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,829,481ක පිරිහීමක් පැවතුණි.

මෙකී මූල්‍ය ප්‍රතිඵලයෙයට රු.55,126,338 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.23,232,394 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.32,219,981 ක් දක්වා වැඩිවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.129,397,018 න් සියයට 66 ක් ලෙස රු.85,291,078 ක්ම උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.55,126,338 ක මුළු මුදලම වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.129,070,981 න් සියයට 34 ක් ලෙස රු.43,508,302 ක් පඩිනඩි වියදම වූ අතර ඉන් සියයට 61 ක් ලෙස රු.26,536,317 ක් වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.23,232,394 න් සියයට 30 ක් ලෙස රු.7,025,024 ක් පමණක් සභා අරමුදල් වැය වූ අතර ඉතිරි සියයට 70 ක් වූ රු.16,207,370 ක ප්‍රමාණය ගමනැගුම, මගනැතුම, වයඹ පුබුදුව වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, කඩකුලී, බදුකුලී වැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කිරීම් සඳහා නෛතික විධිවිධාන පනවා නොමැති වුවද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම එවැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කර තිබුණි.

2.3.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.3,006,576 ක් වූ අතර වාර්ෂික බිල්කිරීම් රු.3,947,631 ක් විය. 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32-42 දක්වා වූ රීතින් ප්‍රකාරව

කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කර, අදාල නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපල තහනමට ගෙන හිඟ වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කර නොතිබුණි.

2.3.3 බදු කුලී

2013 වර්ෂය සඳහා බදු දුන් වත්කම් විෂයයන් 02 කට අදාලව රු. 27,721 ක හිඟයක් හා ඉකුත් වර්ෂ වලට අදාල රු.154,999 ක හිඟයක් සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි.

2.3.4 කඩකුලී

කඩ කාමර වලට අදාලව වර්ෂ ගණනාවක සිට පවතින මාසික වාරික 28-71 අතර පරාසයක රු.189,178 ක හිඟ ශේෂයක් පැවතිණි. එමෙන්ම වෙනත් කඩ කාමර 20 කට අදාලව රු. 427,674 ක හිඟ ශේෂයක්ද පැවතුණි.

2.3.5 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණද, සභාව විසින් පනවන ලද බද්ද කර්මාන්ත හිමියන් හා වෙළඳ ව්‍යාපාරිකයන් විසින් දින 7 ක් ඇතුලත ගෙවන ලෙස නිවේදනය කර නොතිබුණි. එමෙන්ම බලපත්‍ර නොගත් අය හඳුනාගෙන ඒ බව දැනුම්දීමක් හෝ අදාල රීති ප්‍රකාරව කටයුතු කිරීමක්ද සිදුව නොතිබුණි.

2.3.6 පෙර ගෙවුම් මුදල්

කඩ කාමර 24 කින් සමන්විත වැටකෙයාව සාප්පු සංකීර්ණයේ අංක 05 හා 08 කඩ කාමර වලට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට රු.255,294 ක පෙර ගෙවුම් මුදල් හිඟව පැවතුණි. කඩ කාමර 6 වෙනුවෙන් බදුකරුවන් සමඟ කඩ කුලී යටතේ ගිවිසුම් ගතව නොතිබීම හේතුවෙන් 2008 වර්ෂයේ සිට අයකර ගැනීමට තිබූ රු.909,100 ක කුලී මුදලක් සභාවට අහිමිවී තිබුණි. 2011 දෙසැම්බර් 20 වන විට රු.7,204,172 ක පිරිවැයට වැඩ අවසන්ව තිබූ වැටකෙයාව සාප්පු සංකීර්ණයට ජලය හා විදුලිය ලබාදීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව විසින් 2010 - 2012 කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 612 ක් තිබුණද, අනුකූලතා සහතික 94 ක් පමණක් ලබාදී තිබුණි. අයදුම්පත්‍ර 518 සඳහා අනුකූලතා සහතික ලබා නොගැනීම හෝ ගොඩනැගිලි බලපත්‍ර කාලය දීර්ඝ කරවා නොගැනීම පිළිබඳව සභාව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. එම ගොඩනැගිලි සියල්ල ඉදිකර තිබුණි නම් සභා අතුරු ව්‍යවස්ථා අනුව රු.259,000 ක ගොඩනැගිලි අනුකූලතා සහතික පත් ආදායමක්ද අදාල ගොඩනැගිලි ඉදිකිරීම අවසන්ව නොමැති නම් බලපත්‍ර කාලය වාර්ෂිකව දීර්ඝ කරවා ගැනීමේ ගාස්තු ලෙස රු.588,000 ක ආදායමක්ද සභාවට උපයාගත හැකිව තිබුණි.

(ආ). ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර මත මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා පුස්තකාල සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගත් රු.59,133,328 ක ණය හා ඊට අදාල පොලී මුදල් නිසි පරිදි නොගෙවීම මත 2013 තෙවන කාර්තුව දක්වා වූ කාලයට අදාලව රු.733,662 ක දඩ මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. 2013 හතරවන කාර්තුවේ සිට ණය වාරික නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවියයුතු ණය හා පොලී වාරික වටිනාකම රු.7,030,558 ක්ව පැවති අතර, ඊට අදාලව දඩ පොලී ගෙවීමට සිදුවීමේ අවදානමක්ද පැවතුණි.

3.2 <u>අවිධිමත් ගනුදෙනු</u>

මාකදුර පුස්තකාලය සඳහා දැව භාණ්ඩ මිලදී ගැනීමට අදාලව, රාජ්‍ය දැව සංස්ථාවේ කළමනාකරු (කල්දෙමුල්ල සංකීර්ණය) ගේ අංක: රා.අ.ස/4/කල්.සං/මිලගණන්/xi හා 2010 දෙසැම්බර් 18 දිනැති ලිපිය පරිදි භාණ්ඩ වර්ග 18 ක් යටතේ රු.1,867,479 ක් වටිනා භාණ්ඩ විෂයයන් 173 ක් සැපයීමට හා සමාංක හා 2011 ජනවාරි 05 ලිපිය අනුව ඇණවුමේ සඳහන් මිලෙන් සියයට 15 වට්ටමක් ලබාදීමට එකඟව තිබුණි. එපරිදි වූ වට්ටම ලබාගෙන ඇති බවක් හඳුනාගත නොහැකිවූ අතරම, ඇණවුම සඳහා රු.1,269,885 ක් ගෙවා තිබුණ ද සැපයීමට එකඟ වී තිබූ භාණ්ඩ වලින් භාණ්ඩ වර්ග 5 ක් යටතේ රු.311,570 ක් වටිනා භාණ්ඩ විෂයයන් 19 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සපයා නොතිබුණි.

3.3 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ආසියානු බැංකු ණය ආධාර යටතේ රු.85,254,744 ක් හා සභා අරමුදල් යටතේ රු.6,251,000 ක් වැයකර ඉදිකර තිබූ මාකදුර පුස්තකාලය හා සෞඛ්‍ය මධ්‍යස්ථානය, පුස්තකාලයක් හා කඩ කාමර 25 කින් සමන්විත වූ අතර, 2010 දෙසැම්බර් 22 දින අදාල කොන්ත්‍රාත්කාර ආයතනය විසින් වැඩ අවසන් කර සභාව වෙත භාරදී තිබුණි. වෙළඳ සංකීර්ණයේ පැවති කඩ කාමර 25 සඳහා 2012 වර්ෂයේ අවස්ථා 3 කදී හා 2013 වර්ෂයේ අවස්ථා 02 කදී පෙර ගෙවුම් ක්‍රමය යටතේ (කීමනී) ලබාදීමට ටෙන්ඩර් කලද, අවම ලංසුව රු.39,063,000 ක් වූ පහල මහලෙහි කඩ කාමර 24 හා අවම ලංසුව රු.11,106,000 ක් වූ උඩුමහල ක්‍රීඩාගාරය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම බදුදීමට නොහැකි වී තිබුණි. එමෙන්ම මෙම කඩ කාමර ලබාදීමට නොහැකිවීම මත මසකට රු.126,500 බැගින් තක්සේරු ගත කුලී මුදලක් සභාවට අහිමිවී

තිබුණි. එමෙන්ම දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වෙනුවෙන් මාසිකව රු.1,368,000 ක පමණ ණය හා ණය පොලී වාරිකයක් ගෙවීමට සභාවට සිදුව තිබුණි.

(ආ). 2012 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන රු.1,000,000 ක ප්‍රතිපාදන මත තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා පරිගණක හා පරිගණක මේස හා පුටු 12 ක් රු.882,063 වැයකර මිලදීගෙන තිබුණි. මෙකී පරිගණක තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පිහිටුවා නොතිබූ අතර, පරිගණක කට්ටල 9 ක් නිශ්කාර්යව පැවතුණි. මෙම පරිගණක හා උපාංග සඳහා ලබාදී තිබූ වසර 03 ක වගකීම් කාලයද අවසන් වෙමින් පැවතුණි.

4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

4.1 <u>අයවැය පාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛන අනුව පුනරාවර්තන වියදම් වල රු.103,951,000 ක ප්‍රතිපාදනයක් පැවතියද, සත්‍ය වියදම රු.127,771,000 ක් වීමෙන් සියයට 23 ක් ලෙස රු.23,820,000 ක ඉක්මවීමක් පැවතුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම් යටතේ රු.106,011,000 ක ඇස්තමේන්තුවක් පැවතියද ඉන් සියයට 21 ක් වූ රු.22,504,000 ක් පමණක් වැයකර පැවතුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය අනුව රු.128,519,660 ක පුනරාවර්තන ආදායමක් ඇස්තමේන්තුකර පැවතියද, ඉන් සියයට 68 ක් ලෙස රු.86,887,918 ක් පමණක් ලැබී පැවතුණි. සභාවේ උත්පාදිත ආදායම් යටතේ ඇස්තමේන්තුගත ආදායම රු.30,923,660 ක් වූ අතර අයකරගෙන ඇති ආදායම රු.27,554,287 ක් විය.

(ඇ). සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.2,150,000 ක් වටිනා සුභ සාධන කාර්යයන් 05 ක් හා රු.231,687 ක් වටිනා සංවර්ධන කාර්යයන් 04 ක් ඉටුකර නොතිබුණි.

5. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). මූල්‍ය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය

(ඉ). වත්කම් කළමනාකරණය

(ඊ). කොන්ත්‍රාත් පරිපාලනය